නුවරඑළිය මහා නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 25 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 08 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ රු.2,500,000 කින් හා සමුච්චිත අරමුදල් ගිණුම රු.500,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 02 ක් සඳහා ලැබී තිබුණු රු.43,425,171 ක් වූ මූලධන ආධාර ගිණුම්ගතකර නොතිබුණු බැවින් මූලධන ආධාර සහ ප්‍රාග්ධන වියදම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු රු.25,330,864 ක් වුවද එය රු.24,788,545 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.542,319කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.115,000 ක් වූ ෆයිබර් ග්ලාස් වීපී පහන් කණු නිමැවුම් අච්චුව ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම සඳහා ලබාදී තිබුණු රු.1,500,000 ක අත්තිකාරම් පියවා නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් අඩුවෙන් හා නොපියවූ අත්තිකාරම් වැඩියෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.145,000 ක් වටිනා ප්‍රදර්ශන රාක්කය (Display Cupboard) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව දක්වා තිබුණද, ඒ වෙනුවෙන් දෙන ලද අත්තිකාරම පියවීම ගිණුම්ගතකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී රු.2,993,334 කට මිලදීගෙන තිබුණු කන්ටේනර් වැසිකිළි 02ක් ප්‍රාග්ධනගතකර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඌ) 2016 මැදරට පළාත් අභිමාන සම්මාන උළෙලේදී ත්‍යාග මුදල් සහ 2017 වසන්ත උත්සවය සඳහා විවිධ අනුග්‍රාහකයන්ගෙන් ලැබී තිබුණු එකතුව රු.4,225,000 ක් ආදායමට බැර නොකර තැන්පත් යටතේ ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම විටනාකමින් අඩුවෙන් දැක්වුණි.

(එ) සභාව සතු බැංකු ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.889,094 ක ශේෂය ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) සභාව විසින් පෞද්ගලික බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකට සෘජුවම බැරවී තිබුණු රු.51,443 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ඔ) සේවකයන්ගෙන් අයවිය යුතු ණය වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් සභා ගිණුමකට බැරකර තිබුණු රු.126,425 ක් අදාළ ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඕ) බැංකු ගිණුමකට සෘජුව බැරවී තිබුණු රු.474,885 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ක) සභාව නාගරික සංවර්ධන අධිකාරියේ ගනුදෙනු සඳහා රාජ්‍ය බැංකුවක පවත්වා ගෙන යන ඉතිරිකිරීමේ ගිණුමකින් සභාවේ ජංගම ගිණුමකට බැර කර තිබුණු රු.2,942,100 ක් ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලපරාසයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.1,665,194 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 10 අතර කාලපරාසයකට අදාළ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.48,257,328 ක් විය.

1.3.3 අනුකූල නොවීම්

--------------------

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------------

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ---------------------------------- | ----------- | ------------------- |
| | | රු. | |
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | 213,360 | ව්‍යාපාර 56 ක බලපත්‍ර අලුත්කර නොතිබුණු අතර, බදු මුදල් සහ මුද්දර ගාස්තු රු.213,360 ක් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------------------<br>මුදල් රෙගුලාසි 371 (2) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 360,000 | 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 07 කදී විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.360,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම 2018 පෙබරවාරි වන විටත් පියවා නොතිබුණි. |
| | | 460,270 | මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන්ට අවස්ථා 07 කදී රු.460,270 ක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. |
| | | 330,000 | එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම මුදල රු.100,000ක් වුවද එම සීමාව ඉක්මවා අවස්ථා 02කදී රු.330,000 ක් ලබාදී තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 103 (1) හා මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය රීති 54 | 655,402 | සභාවට අයත් වාහන 05 ක් අනතුරට ලක් වී රු.655,402 ක් අලාභ සිදුවී තිබුණද අනතුරු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | (i). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය | 784,153 | නාගරික ඉංජිනේරුවරයා සහ නාගරික කොමසාරිස්වරයා පරිහරණය කරන රජයේ නිවාසවලට සභා අරමුදලින් රු.784,153 ක් වැයකර තිර රෙදි සපයා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii). | XIX වැනි පරිච්ඡේදයේ 5 වන වගන්තිය | 203,831 | සභාවට අයත් උපලේඛනගත නිවාසවල පදිංචි නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.140,612 ක නිවාස කුලී අයකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.107,228,622 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.292,610,584 ක් විය

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). | වරිපනම් හා බදු | 82,248,792 | 86,961,780 | 82,637,247 | 93,255,272 | 79,600,000 | 87,652,308 | 92,193,341 | 92,483,611 |
| (ii). | කුලී | 83,038,586 | 48,619,605 | 47,505,781 | 40,637,959 | 69,769,544 | 41,850,851 | 46,080,115 | 36,717,443 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 22,712,000 | 22,350,622 | 22,204,028 | 1,424,360 | 18,317,000 | 20,957,232 | 21,059,519 | 1,333,360 |
| (iv). | වෙනත් ආදායම් | 157,353,000 | 157,989,575 | 144,979,163 | 194,695,830 | 118,426,000 | 154,225,665 | 141,831,318 | 175,330,061 |

2.2.2 වරිපනම් හා බදු

(අ) වරිපනම්

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.65,408,453 ක හිඟ වරිපනම් බදුවලින් වර්ෂය තුළ රු.19,771,179 ක් හෙවත් සියයට 30 ක් අයවී තිබුණු අතර, තවදුරටත් රු.45,637,274 ක් අයවිය යුතුව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් බදු රු.39,136,274

ක් වූ අතර, එයින් රු.22,611,278 ක් හෙවත් සියයට 58 ක් අයකර තිබුණු අතර තවදුරටත් රු.16,524,996 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) ජල ගාස්තු

-------------

2017 ජනවාරි 01 දිනට රු.27,075,157 ක හිඟ ආදායමක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම රු.51,531,033 ක් විය. වර්ෂය තුළ මුළු අයකිරීම රු.46,426,335 ක් වූ අතර හිඟ ජල ගාස්තු රු.32,179,855 ක් විය. මේ අනුව වර්ෂය ආරම්භයේ හිඟයෙන් හා වර්ෂයේ බිල්කිරීම්වලින් අයවීමේ ප්‍රගතිය සියයට 59.06 ක් විය.

(ඇ). ඉඩම් බදු

-----------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.16,630,228 ක හිඟ ඉඩම් බදුවලින් වර්ෂය තුළ රු.1,373,560 ක් හෙවත් සියයට 8.26 ක් අයවී තිබුණු අතර, තවදුරටත් රු.15,256,668 ක් අයවිය යුතුව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ඉඩම් බදු ආදායම රු.1,742,247 ක් වූ අතර, එයින් රු.483,557 ක් හෙවත් සියයට 27.75ක් පමණක් අයකර තිබුණි.

2.2.3 කුලී

-----

(අ). කඩකුලී

----------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.14,385,365 ක හිඟ කඩ කුලීවලින් වර්ෂය තුළ රු.9,301,781 ක් හෙවත් සියයට 64.66 ක් අයවී තිබුණු අතර, තවදුරටත් රු.5,083,584 ක් අයවිය යුතුව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ කඩකුලී ආදායම රු.18,496,072 ක් වූ අතර, එයින් රු.5,550,380 ක් හෙවත් 30 ක් පමණක් අයකර තිබුණි.

(ආ). ගෙවල් කුලී

--------------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.501,586 ක හිඟ ගෙවල් කුලීවලින් වර්ෂය තුළ රු.108,600 ක් හෙවත් සියයට 21.65 ක් අයවී තිබුණු අතර, තවදුරටත් රු.392,986 ක් අයවිය යුතුව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ගෙවල් කුලී ආදායම රු.80,700 ක් වූ අතර, වර්ෂය තුළ ඉන් රු.2,664 ක් හෙවත් සියයට 3.30 ක් පමණක් අයකර තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.531,553 ක් හා මුද්දර ගාස්තු රු.24,788,545 ක් විය.

2.2.5 අධිභාර

---------

මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල පැනවූ අධිභාරවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.300,000 ක් අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යසාධනය
-----------------

මහා නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
-------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

2017 වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන වැඩසටහන් 03 ක් සඳහා රු.135,719,410 ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය තුළ රු.50,310,064 ක් පමණක් වැයකර තිබුණි. මේ අනුව ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදමෙන් රු.85,409,346ක් උපයෝජනයක් කර නොතිබුණු අතර එය එක් එක් වැඩසටහන් අනුව ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 92 දක්වා පරාසයක ඌන උපයෝජනයක් විය.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව ප්‍රමාණවත්ව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නුවරඑළිය ග්‍රෙගරි වැව පරිශ්‍රයේ බාහිර පාර්ශවයන් විසින් පවත්වා තිබුණු විවිධ විනෝද ක්‍රීඩා සංදර්ශන වලින් සමාලෝචිත වර්ෂය තුළ සභාවට අයවිය යුතු විනෝද බදු අයකර ගැනීමේදී විධිමත් ආකාරයකට කටයුතු කර නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් විවිධ අඩුපාඩු නිරීක්ෂණය විය.

(ආ). සභාව විසින් 2007 – 2017 අතර කාලපරිච්ඡේදය තුළ අනුමතකර තිබුණු ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව 883 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට අනුකූලතා සහතික නිකුත්කර තිබුණු ප්‍රමාණය 106 ක් විය. මේ අනුව ගොඩනැගිලි අයදුම්පත් 777 ක් වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණු අතර, ඊට අදාළ ගොඩනැගිලි ඉදිකර තිබේද යන්න පසුවිපරම් කර නොතිබුණි.

(ඇ). ඉදිරි වර්ෂ 05 ක කාලයක් තුළ ග්‍රෙගරි වැවේ බෝට්ටු සේවාව පවත්වාගෙන යාමට බෝට්ටුහිමියන් 17 දෙනෙකු සඳහා 2016 ජුලි 10 දින මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී තිබුණද, එම බෝට්ටු හිමියන් සමඟ අදාළ ගාස්තු, නියමයන් හා කොන්දේසි ඇතුළත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එක් බෝට්ටු හිමියෙකු විසින් ධාවනයේ යෙදවිය හැකි

බෝට්ටු සංඛ්‍යාව පිළිබඳ සීමාවන් දක්වා නොතිබුණු අතර, බෝට්ටුහිමියන් දෙදෙනෙකු විසින් බෝට්ටු 55 ක් ධාවනයේ යොදවා තිබුණු බවද නිරීක්ෂණය විය. එමෙන්ම 2016 හා 2017 වර්ෂවලට අදාළව බෝට්ටුහිමියන් දෙදෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.532,957 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

---------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 34 ක පුරප්පාඩු 147 ක් පැවති අතර, තනතුරු 01 ක අතිරික්තයක් පැවතිණි.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

වසන්ත උත්සවයේ අවශ්‍යතාවය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,993,335 ක් ගෙවා කන්ටේනර් වැසිකිළි දෙකක් සභාවට මිලදීගෙන තිබුණු අතර, 2018 අගෝස්තු 28 දින වන විටද ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 25 දින විගණනයට ඉදිරිපත්කර තිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම හා වියදම, තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 03 ක සියයට 41 සිට සියයට 73 දක්වා සහ වියදම් විෂයයන් 08 ක සියයට 12 සිට සියයට 155 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ආදායම් කළමනාකරණය | හිග ආදායම් අයකර නොගැනීම |
| ණයගැති/ ණයහිමි | පැරණි ශේෂ නිරවුල් නොකිරීම |
| වත්කම් කළමනාකරණය | ප්‍රශස්ත ලෙස උපයෝජනය නොකිරීම<br>මනාව නඩත්තු හෝ අලුත්වැඩියා කටයුතු නොකිරීම. |